ගැනුම් මිළ ගෙවා බලපත්‍රයක් ලබාගැනීම

- ✓ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ තෝරා ගැනෙන අඩු ආදායම් හා වැඩි ආදායම් කාණ්ඩවල පුද්ගලයන්ට පදිංචියට හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩමෙහි තක්සේරු වටිනාකම ගැනුම් මිළ ලෙස අයකර බලපත්‍ර නිකුත් කරනු ලබයි.

- ✓ ඉඩමෙහි තක්සේරු ලබාගැනීම සිදුවන්නේ කෙසේ ද ?
  - ➢ ඉඩම් කච්චේරිය පවත්වන ලද වර්ෂයට අදාලව පළමුව කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිගේ දළ තක්සේරුව මත
  - ➢ අනතුරුව තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත

- ✓ තක්සේරු ගැනුම් මිළ ගෙවිය හැකි ආකාරය ?
  - ➢ තක්සේරු ගැනුම් මුදල එක්වර ගෙවීම
  - ➢ තක්සේරු ගැනුම් මුදල වාර්ෂික වාරිකවලින් වසර 10 ක් තුළ ගෙවීම (වසරකට 4% බැගින් වූ පොලී මුදලක් ද අය කරනු ලබයි.)

- ❖ ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව නොමිලේ බලපත්‍රයක් ලබාදීම කළ හැක්කේ ගොවි පන්තියේ අයට පමණි. ගොවි පන්තියට ඇතුළත් වන්නේ රු. 144,000/- නොවැඩි වාර්ෂික ආදායමක් කෘෂි කර්මාන්තය හෝ ඒ ආශ්‍රිත කටයුත්තකින් ලබන පුද්ගලයන් පමණි.

- ❖ ගැනුම් මිළ සඳහා අදාල වන්නේ තම පවුලේ වාර්ෂික ආදායම රු. 500,000 ට අඩු හා අවිවාහක වාර්ෂික ආදායම රු. 480,000 ට අඩුවෙන් ලබන අය (ගොවි පන්තිය හැර) අඩු හා වැඩි ආදායම් කාණ්ඩවල අය පමණි.